මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

කාර්යාලය / காரியாலயம் / Office: 081-2213097
ලේකම් / செயலாளர் / Secretary: 081-2213096
වට්ස් ඇප් අංකය / வட்ஸ்அப் இல. / Whatsapp No: 0707213097
ෆැක්ස් / பெக்ஸ் / Fax: 081-2213082

මගේ අංකය / எனது இல. / My No.: CPC/PSC/9/1/1/2027-I
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2026.06.30

මධ්‍යම පළාතේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා සභා ලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ආයතන ප්‍රධානීන් වෙත,

<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු - 2027</u>

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018.09.03 දිනැතිව අනුමත කරන ලද හා 2024.08.22 දිනැතිව සංශෝධනය කර අනුමත කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව 2027 වර්ෂයට අදාළව, **<u>මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරී සේවයේ හැර (2026.02.02. දිනැති අංක 2474/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ශ්‍රී ලංකා ගුරු සේවයට උපාධිධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් බහුතරයක් ඉදිරිපත් වී ඇති බැවින්)</u>** අනෙකුත් සේවාවන් සඳහා වාර්ෂික ස්ථාන මාරු පහත පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට, ආණ්ඩුකාර ලේකම්ගේ අංක: GCP/02/AT- 2027 හා 2026.06.26 දිනැති ලිපිය මගින් ලබාදී ඇති ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය හා බැඳේ.

| සේවාව | ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ දිනය |
|---|---|
| • මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණිය<br>• මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවය<br>• මධ්‍යම පළාත් තාක්ෂණ නිලධාරි සේවය<br>• මධ්‍යම පළාත් මෝටර් රථ රියදුරු සේවය<br>• මධ්‍යම පළාත් කාර්යාල සේවක සේවය | 2027 ජනවාරි 01 දින සිට |

02. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ඉහත සේවාවන් වලට අදාළ 2027 වාර්ෂික ස්ථාන මාරු **<u>2027.01.01 දින සිට</u> බලපැවැත්වෙන සේ ක්‍රියාත්මක කිරීමට** මෙම කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත. ඒ අනුව වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි 2026.07.01 දින සිට සියළුම අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අත්හිටුවිය යුතු වේ. **2026.07.01 දින සිට 2027 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය දක්වා සුහද ස්ථාන මාරුවීම් සහ අනෙකුත් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා** අයදුම්පත්‍ර භාර නොගැනේ.

03. 2027 වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් නිලධරයන් :

| සේවාව | 2027 වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් නිලධරයන් |
|---|---|
| මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණිය | වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2 යටතේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති, සේවයට අදාළ සියළුම නිලධරයන් |
| මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවය | වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2 යටතේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති, සේවයට අදාළ සියළුම නිලධරයන් |
| මධ්‍යම පළාත් තාක්ෂණ නිලධාරී සේවය | වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2 යටතේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති, සේවයට අදාළ සියළුම නිලධරයන් |
| මධ්‍යම පළාත් මෝටර් රථ රියදුරු සේවය | රා.ප.ච 25/2014 යටතේ පත්වීම්ලාභීන් හැර වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2 යටතේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති, සේවයට අදාළ සියළුම නිලධරයන් |
| මධ්‍යම පළාත් කාර්යාල සේවක සේවය | රා.ප.ච 25/2014 යටතේ පත්වීම්ලාභීන් හැර වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2 යටතේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති, සේවයට අදාළ සියළුම නිලධරයන් |

04. වාර්ෂික ස්ථාන මාරු සඳහා **සුදුසුකම් ලැබීම සහ අයදුම්කිරීම :**

I. වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ **2.2, 2.4** සහ **2.4.1** ඡේදයන් හි විධිවිධාන අනුව **2026.12.31** දිනට එකම සේවා ස්ථානයක වසර **05** කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් **සහ 2.2.3** ඡේදයේ සඳහන් පරිදි දිරි දීමනා ගෙවනු ලබන ප්‍රියමනාප සේවා ස්ථානයක **වසර 03 ක් සම්පූර්ණ කළ නිලධරයන්** අනිවාර්යයෙන්ම **වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත** සම්පූර්ණ කර ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු බවට ඔබගේ කාර්යාලයේ සහ ඔබ යටතේ පවතින සියළුම උප කාර්යාලවල සේවය කරන නිලධාරීන් දැනුවත් කළ යුතු වේ. (පළාත් පාලන ආයතනවල සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්ගේ ස්ථාන මාරු අයදුම්පත්‍ර <u>පළාත් පාලන කොමසාරිස්</u> වෙත ඉදිරිපත් කළ යුතු අතර, රෝහල් ඇතුළු සියළුම සෞඛ්‍ය ආයතනවල නිලධරයන්ගේ අදාළ අයදුම්පත් <u>ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත</u> ඉදිරිපත් කළ යුතු වේ)

II. මෙම කොමිෂන් සභාවේ **නිල වෙබ් අඩවිය** වන <u>*www.psc.cp.gov.lk*</u> හි ස්ථාන මාරු පරිපාටිය පළකර ඇති අතර, මෙම ලිපිය සමඟ ඇති පහත සඳහන් <u>වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත</u> භාගත කර අදාළ නිලධාරීන් වෙතින් සම්පූර්ණ කරවා ගත යුතුය. **<u>නියමිත සේවා කාලය සම්පූර්ණ වී ඇති නමුත් අයදුම්පත් ඉදිරිපත් නොකළ නිලධාරීන් සිටින්නේ නම්</u>** එම නිලධාරීන්ගේ තොරතුරුද අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු වේ. එසේ නියමිත සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගේ තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, ස්ථාන මාරු මණ්ඩලයට සාධාරණ හා නිවැරදි තීරණ ලබාදීම දුෂ්කර වන බැවින්, **<u>නියමිත තොරතුරු ඉදිරිපත් නොකිරීම මත ඇතිවන ගැටළු පිළිබඳව ආයතන ප්‍රධානීන් පෞද්ගලිකවම වගකිව යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි</u>**. ඒ අනුව මේ පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කරන ලෙස ද සඳහන් කරමි.

| සේවාව . | අදාළ ස්ථාන මාරු ආකෘති පත්‍රය |
|---|---|
| මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණිය | ම.ප./වා.ස්.මා./SUPRA-01 ආකෘති පත්‍රය |
| මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවය | ම.ප./වා.ස්.මා./ MSO-01 ආකෘති පත්‍රය |
| මධ්‍යම පළාත් තාක්ෂණ නිලධාරී සේවය | ම.ප./වා.ස්.මා./ TO-01 ආකෘති පත්‍රය |
| මධ්‍යම පළාත් මෝටර් රථ රියදුරු සේවය | ම.ප./වා.ස්.මා./ DRV-01 ආකෘති පත්‍රය |
| මධ්‍යම පළාත් කාර්යාල සේවක සේවය | ම.ප./වා.ස්.මා./KKS-01 ආකෘති පත්‍රය |

05. ඒ අනුව, **2027** වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු මාර්ගගත ක්‍රමයට **(Online)** සිදුකිරීමට නියමිත බැවින් එම කටයුතු සිදු කිරීමේදී අදාළ විෂය භාර නිලධරයා පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතු වේ.

I. මුලින්ම ඔබගේ ආයතනයේ Gmail නිල විද්‍යුත් තැපැල වෙත පිවිසෙන්න.

II. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ කටයුතු සඳහා පමණක් භාවිත වන විද්‍යුත් තැපැල් ලිපිනය වන trans.psc.cp.gov@gmail.com මඟින් ඔබ ආයතනයේ විද්‍යුත් තැපැල වෙත එවන ලද අදාළ සේවාවට අයත් Google spreadsheet වෙත පිවිසෙන්න.

| | |
|---|---|
| 1 | 2027 - (SUPRA) වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන් පිළිබඳ තොරතුරු ලේඛනය (Google spreadsheet) |
| 2 | 2027 - (MSO) වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරීන් පිළිබඳ තොරතුරු ලේඛනය (Google spreadsheet) |
| 3 | 2027 - (TO) වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් තාක්ෂණ සේවා නිලධාරීන් පිළිබඳ තොරතුරු ලේඛනය (Google spreadsheet) |
| 4 | 2027 - (DRV) වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් මෝටර් රථ රියදුරු සේවයේ නිලධාරීන් පිළිබඳ තොරතුරු ලේඛනය (Google spreadsheet) |
| 5 | 2027 - (KKS) වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් කාර්යාල සේවක සේවයේ නිලධාරීන් පිළිබඳ තොරතුරු ලේඛනය (Google spreadsheet) |

III. එහි තොරතුරු ඇතුළත් කිරීමේදී **Unicode (Iskoola potha)** අකුරු වර්ගය භාවිතා කළ යුතුය.

IV. **ඉහත සඳහන් සේවාවන්ට අදාළ** Google spreadsheet හි ඇති වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් නිලධාරීන්ගේ තොරතුරු හි **ඔබගේ ආයතනයට පමණක් අදාළ ස්ථානයක් වෙන් කර** ඇති අතර අදාළ විෂය භාර නිලධරයා විසින් ස්ථාන මාරු සඳහා යටත් නිලධාරීන් වෙතින් සම්පූර්ණ කරවාගත් **වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්වල** සඳහන් සියළු තොරතුරු නිවැරදිව ඇතුළත් කරන්න. පෙර වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබ සිටින නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් නොකළ යුතු අතර, එම නිලධාරීන් ස්ථාන මාරු නියෝග ලද නව සේවා ස්ථාන වෙත කඩිනමින් මුදා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.

V. **ඔබ ආයතනයේ වැඩිම සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධරයාගේ සිට සේවා කාලය අඩුවන අනුපිළිවෙලට ස්ථාන මාරු ලේඛනයේ තොරතුරු ඇතුළත් කළ යුතුය.**

VI. වසර **05** කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් සහ දිරි දීමනා ගෙවනු ලබන ප්‍රියමනාප සේවා ස්ථානයක **වසර 03 ක් සම්පූර්ණ කළ නිලධරයන්** අතරින් **ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් නොකරන නිලධාරීන් සිටී නම්** එම නිලධාරීන්ගේ තොරතුරු ද අයදුම්පත් ඉදිරිපත් කළ නිලධාරීන්ගේ තොරතුරුවලට පසුව, අදාළ Google spreadsheet හි ඇතුළත් **කිරීම අනිවාර්ය වේ.**

VII. නිලධාරීන්ගේ ස්ථානමාරු අයදුම්පත් එවීම අවශ්‍ය නොවන අතර එම නිලධාරීන්ගේ විස්තර ඇතුළත් Google spreadsheet හි **වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් නිලධරයන් සම්බන්ධ වාර්තාව පමණක් මුද්‍රණයකර** (Print out) **ආයතන ප්‍රධානියාගේ අත්සන සහ මුද්‍රාව සහිතව තැපැල මඟින් අප වෙත එවිය යුතුය.**

VIII. වෙනත් විශේෂ තොරතුරු හෝ උපදෙස් ඔබ ආයතනයේ විද්‍යුත් තැපැල වෙත යොමු කරන බැවින් විද්‍යුත් තැපැල පිළිබඳව විමසිල්ලෙන් සිටින ලෙස අදාළ විෂය නිලධාරියා දැනුවත් කිරීම කළ යුතුය.

06. ඒ අනුව ඉහත උපදෙස් අනුගමනය කර **2027** වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් ඉහත සේවාවල නිලධාරීන් පිළිබඳ තොරතුරු ලේඛනයන් (Google spreadsheet) හි තොරතුරු ඇතුළත් කර (අයදුම්පත් එවීම අවශ්‍ය නොවේ) එහි දක්වා ඇති වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් සියලුම නිලධරයන් සම්බන්ධ තොරතුරු සහිත වාර්තාවේ දෘඪ පිටපත පමණක් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය වන **2026.08.20** දිනට පෙර මෙම කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

07. මීට පෙර ස්ථාන මාරු නියෝග ලැබූ නිලධාරීන් අතරින් ඇතැම් නිලධාරීන් නියමිත කාලය තුල නව සේවා ස්ථානයන් වෙත නිදහස් කළ ද, තවත් නිලධාරීන් පිරිසක් නිදහස් නොකර සිටින බව මෙම කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වී ඇති හෙයින් පෙර වර්ෂයන්හි වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා මේ දක්වා මුදාහැර නොමැති සියළුම නිලධාරීන් වහාම මුදහැරීමට කටයුතු කරන ලෙස දන්වමි.

08. වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව සෑම නිලධාරියෙකුම වර්ෂ 05 කට පසු අනිවාර්යයෙන්ම වාර්ෂික ස්ථාන මාරුවලට යටත්වීම පිළිබඳ ආයතන ප්‍රධානීන්ගේ අවධානය යොමු කර, වාර්ෂික ස්ථාන මාරු හේතුවෙන් ආයතනික කටයුතු අඩපණවීමකින් තොරව පවත්වාගෙන යාම සඳහා නිලධාරීන් කළමනාකරණය කිරීම තුළින් ආයතනික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගැනීම ආයතන ප්‍රධානීන්ගේ වගකීමක් වන බව වැඩිදුරටත් දන්වා සිටින අතර, **(මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.4 ඡේදයේ (vi) වගන්තිය)** මේ පිළිබඳව ඔබේ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව ,
මධ්‍යම පළාත.

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

පිටපත් -

1. ඉහත සේවාවන් වලට අදාළ නිලධාරීන් සාමාජිකත්වය දරන - දැ.ගැ.ස
   සියළුම වෘත්තිය සංගම් වෙත

2. අදාළ විෂය භාර නිලධරයන් වෙත - **ඉහත උපදෙස් අනුගමනය කිරීම සඳහා මෙම ලිපියේ පිටපතක් ලබාගන්න.**